සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 02 /2023

මගේ අංකය: PPSC/ES/14/FI/06/3-2
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2023.01.04

ලේකම්
සමාජ සුභසාධන,පරිවාස හා ළමාරක්ෂක,ග්‍රාම සංවර්ධන
සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 පෙබරවාරි**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කරන නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරීන්ගේ දැනගැනීම සඳහා ද මෙය යැවිය යුතු වේ.

02. අදාළ බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය | i. ව්‍යාපෘතියක් යන්න නිර්වචනය කිරීම<br>ii. ව්‍යාපෘති කළමනාකරණය<br>iii. ව්‍යාපෘති චක්‍රය<br>iv. ව්‍යාපෘති පිළියෙල කිරීම සහ විග්‍රහ කිරීම<br>v. ව්‍යාපෘති ඇගයීම<br>➢ පිළිගෙවුම් කාලය<br>➢ ශුද්ධ වර්තමාන වටිනාකම<br>➢ අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය<br>➢ පිරිවැය ප්‍රතිලාභ අනුපාතය<br>➢ වාර්ෂික සාමාන්‍ය ඉපැයුම් අනුපාතය<br>vi. ව්‍යාපෘති සංවිධානය<br>vii. ඡායා මිල යොදා ගැනීම | පැය 03 | 100 | 40 |

*සටහන:-* සාමාර්ථය සඳහා එක් විෂයකට **40%**කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.

03. **විභාගයට අයදුම්කිරීම** - අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2023.01.31** දින හෝ ඊට පෙර ලැබෙන සේ යොමු කල යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මීට පෙර I වන ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම්කරන්නේ නම් රු **500/-**ක, විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

එස්.එම්.ඩී.සී.සමරසේකර
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

<u>පිටපත්</u>

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ I ශ්‍රේණියේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 පෙබරවාරි**

01. (a) මුලකුරු සමඟ නම:-

.................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(b) සම්පූර්ණ නම:-

.................................................................................................................

(c) මුලකුරු සමඟ නම:-

.................................................................................................................

(d) රාජකාරී ලිපිනය:-

.................................................................................................................

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(e) ස්ත්‍රී / පුරුෂ භාවය:-.........................................................................

(f) දුරකථන අංකය පෞද්ගලික:- ...................................................

(g) දුරකථන අංකය රාජකාරි :- ...................................................

(h) පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය-............................................

(i)දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ වර්ෂය-............................................

(j)තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනී සිටි වාර ගණන-................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

03. උපන් දිනය:- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

04. ඔබ ග්‍රාම සංවර්ධන නිලධාරි I ශ්‍රේණියට උසස් වූ දිනය:-....................................................

05. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- ........................................................

(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

........................................................

දිනය :- දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)